www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීන ආර්ථික විශේෂඥයෝ වසර 30ක් තුල 'විශාලතම සකස්වීම' පිලිබඳ අනතුරු අඟවති

## Chinese economists warn of the "biggest adjustment" in 30 years

**ජෝන් චෑන් විසිනි**
**2008 සැප්තැම්බර් 12**

පසුගිය සති අන්තයේ ෆ්‍රෙඩී මැක් සහ ෆැනී මායි හට ඇප ලබාදීම පිලිබඳව වෝල් ස්ට්‍රීට් වෙතින් ප්‍රශංසා ලැබෙන අතරේදී, චීන රජය විසිනුත් එය උනුසුම්ව පිලිගැනින. මෙම උගස් බලවතුන් දෙදෙනාගෙන් චීන බැංකු අත්පත් කරගෙන ඇති ඩොලර් බිලියන දස ගනනක බැඳුම්කර සම්බන්ධව ඉතා ඉක්මනින්ම බීජිං සිය සැලකිල්ල යොමු කලේය. ඒ සමගම, පාරිභෝගික වියදම් අඩුවීම කරන කොටගෙන චීන අපනයන මිලදීගැනීම් දුර්වල වීමට හේතුවුන ද්විතික මූල්‍ය වෙලඳ පලෙහි (sub prime) අර්බුදයෙන් එ.ජ. ගොඩප්මේ කිසියම් හෝ සංඥාවක් පිලිබදව චීන නිෂ්පාදකයෝ නොඉවසිලිමත්ව බලා සිටිති.

එ.ජ. යේ, යුරෝපයේ සහ ජපානයේ ආර්ථික පසුබෑමෙන් ගලන ප්‍රධාන දුෂ්කරතා ගැන චීනයේ බොහෝ පලමුපෙලේ ආර්ථික විශේෂඥයින් අනතුරු ඇඟවීමට පටන් ගෙන ඇත. 1990 ගනන් වල සිට එ.ජ. යට සහ අනෙකුත් බටහිර වෙලඳපොලට ලාබ පාරිභෝගික භාන්ඩ අලෙවිකිරීමේ පදනම මත ආර්ථිකය පුලුල්වීමෙන් පසු, ඉල්ලුමේ දරුනු කඩාවැටීමක් විශාල විරැකියාතත්වයකට සහ පලල් ලෙස පැතිරුනු සමාජ අසහනයක් පැන නැංවීමට තුඩු දිය හැක.

සමාජ විද්‍යාව පිලිබඳ නිල චීන ඇකඩමියේ (CASS) ලෝක ආර්ථික හා දේශපාලන පර්යේෂන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලී ෂියැංයන් සැප්තැම්බර් 1 දා ෆස්ට් ෆයිනැන්ෂල් ඩේලි සමග කල සාකච්ඡාවකදී, ප්‍රධාන භූගෝලීය අර්බුදයක අවදානම බොහෝ කාලයකට අවතක්සේරු කල චීන ආර්ථික විශේෂඥයින් හට මෙම ද්විතික මූල්‍ය වෙලඳ පලෙහි දියවීම කටුක පිබිදවීමක් බව පිලිගත්තේය.

1970 ගනන්වල භූගෝලීය මන්දාවධමනය සහ 1929 දී සිදුවූ මහා අවපාතය අතීතයට උරුම සිද්ධීන් ලෙස විශ්වාස කරමින් බොහෝ චීන ආර්ථික විශේෂඥයින් 1990 ගනන්වල බටහිර නව ලිබරල් න්‍යායයන් ආභාෂයට ගත් ආකාරය ලී පෙන්වා දුන්නේය. වැඩෙන භූගෝලීය පල්ලම් බැහීම පිලිබදව දැනුවත් වීම එමගින් දුර්වල වූ බව සදහන් කරමින් "වසර ගනනාවක් තිස්සේ චීන ආර්ථික කවවල මෙම සංකල්පය ආධිපත්‍ය ගෙන තිබුනා" යැයි ලී පැවසීය.

1978 දී, චීන කොමියුනිස්ට් පක්ෂ (CPP) රජය ධනවාදී වෙලඳපොල වෙත හැරීමේ සිට, නිල ස්ටැලින්වාදී න්‍යායාචාර්යවරු සහ උගත්තු තම " සමාජවාදී" මවා පෑම් මුලුමනින්ම ඉවත දමා දැන් විවෘතවම නව ධනවාදී ප්‍රභූවට සේවය කරති. ධනවාදයේ කඩාවැටීම පිලිබඳ මාක්ස්වාදී න්‍යාය "යල්පැනගිය" ලෙසට බැහැරකරමින්, ලෝක ධනවාදය තම පරස්පරයන් හසුරුවා ගැනීමට ඉගෙනගෙන ඇති බවත්, විසිවන සියවසේ පලමු භාගයේ ඇති වූ ආර්ථික අවපාතයන් සමාජ විප්ලවයන් සහ අධිරාජ්‍යවාදී යුද්ධයන් කිසිදිනක නොඑන බවත්, ඔවුහු ප්‍රකාශ කරති. එවැනි තර්කනයන් මේ වනවිට බරපතල ලෙස වැරදි සහගත බව පෙනේ.

"ප්‍රතිසංස්කරනය වීමෙන් සහ විවෘත වීමෙන් 30 වසරකදී චීනය අතිශයින්ම බරපතල බාහිර කම්පනයකට" මුහුන දෙමින් සිටි බව ලී පිලිගත්තේය. 1970 ගනන් මැද කාලය පුරාවටම ලෝක ආර්ථිකය එකතැන පල්වීමේ සහ තද උද්ධමනයේ සම්මිශ්‍රනයකට (ස්ටැග්ෆ්ලේෂන්) හසුව තිබියදී, චීනය ආවෘත ආර්ථිකයක් විය. එහි වෙලඳපොල ප්‍රතිසංස්කරන ඇත්ත වශයෙන්ම ආරම්භ වූයේ 1978 දීය. 1997-98 දී ඇතිවූ ආසියානු මූල්‍ය අර්බුදය, උතුරු ඇමරිකාවේ සහ යුරෝපයේ සංවර්ධිත ආර්ථිකයන්ට විශාල ලෙස බලනොපෑ බැවින් චීනයට එමගින් එතරම් බලපෑමක් ඇති නොවිනි. "ගිනියම් මුදල්"හෝ සමපෙක්ෂක ප්‍රාග්ධනය ඩොලර් බිලියන සිය ගනන් රට තුලට පොම්ප කෙරෙන අද මෙන් නොව එදා ඒ වනවිටත් චීනය ආවෘත ප්‍රාග්ධන වෙලඳපොලක්ව තිබුනි. චීනයට දැන් භූගෝලීය ආර්ථික අර්බුදයෙන් "විසංධිවෙන්නට" හැකියාව නැති බවට ලී අනතුරු අගවයි.

1991 දී පැරනි සෝවියට් සංගමයේ ධනවාදය පුනස්ථාපනයෙන් සහ 1989 දී ටියනන්මන් චතුරශ්‍රයේදී විරෝධතාවන් මැඩපැවැත්වීමෙන් පසු කාලීනව චීනය දැවැන්ත ශ්‍රම වෙලඳපොලකට පරිවර්තනය වීමෙන් ලෝක ධනවාදයට අතිශයින්ම අවශ්‍යව පැවති පිම්මක්

සැපයිනි. උද්ධමනික පීඩනයේ බියෙන් තොරව ලාබ නය ප්‍රතිපත්තියක් තබා ගැනීමට එ.ජ. ආර්ථික ප්‍රතිපත්ති සාදන්නන්ට හැකියාව ලබා දුන්නේ චීනයේ නිෂ්පාදිත අඩු මිල භාන්ඩයන්ය. අඩු පොලී අනුපාතයන් පසුගිය දශකය පුරාවටම එ.ජ.යේ නිවාස බුබුල සහ නය මත දිවෙන පරිභෝජනයට පදනම සකස් කල අතර එහි ප්‍රතිපලයක් ලෙස චීන භාන්ඩ වලට දැවැන්ත වෙලඳපොලක් සැපයීය.

දැන් මෙම ක්‍රමය අවසානයකට පැමින ඇත. ලී විස්තර ආකාරයටඃ "හෙට දින ඉපයීම මත අද වියදම් කිරීම" පදනම් කොට පවත්වාගෙන යා නොහැකි ආර්ථික වැඩීමේ අවසානය සලකුනු කරමින්, ද්විතික මූල්‍ය වෙලද පලෙහි අර්බුදය, එ.ජ. යේ වසර ගනනාවක් පුරා නය මත දිවෙන පරිභෝජනයට සත්තකින්ම "නිවැරදිකිරීමක්" විය. කෙසේවුවත්, මෙම "නිවැරදිකිරීමේ" වියදම සෙසු ලෝකය විසින් දරන ලදී. එ.ජ. ආර්ථිකය තුල පුද්ගලික සමාගම්වල "හෙට දින ඉපයීම අද වියදම් කිරීමේ" නය සමාජගත කරන ලදී. රජයේ මැදිහත්වීමෙන්, අතදිගහැර වියදම්කරන්නන්ගේ බිල්පත් ඉතිරිකරන්නන් විසින් ගෙවන ලදී. ඒ අතරම ඇමරිකානු නය භූගෝලීය කෙරිනි. උද්ධමනය සහ ඩොලරයේ අවප්‍රමානවීම හරහා ඇමරිකානු පාරිභෝගිකයන්ගේ බිල්පත් භූගෝලීය ඉතිරිකරන්නෝ ගෙවා දැමූහ. මේ ලෝක වලංගු මුදලේ හිමිකරයා වීමේ විශේෂ අයිතිවාසිකමයි."

එ.ජ. මූල්‍ය සංගතවල ප්‍රධානීන් නිදහස් වෙන අතරේදී, බැසයන භූගෝලීය ඉල්ලුම සහ ඉහල යන භාන්ඩ මිල ගනන් සමග දැන් සටන් වදින චීනයේ ධනවාදී ප්‍රභූව අතරේ මෙම ප්‍රකාශ යම්කිසි දොම්නසක් වගා දිගා කරයි. බටහිර බහුජාතික සමාගම් සඳහා එකලස් කිරීමේ මාර්ගයක් ලෙස පවතිනවාට වඩා, තමන්ගේම අන්තර්ජාතික සමාගම් ගොඩනගන ලෙස ලී චීනයට කීවේය.

## වැඩිවන නය සහ බංකොලොත්වීම්

මෝර්ගන් ස්ටැන්ලි හි හිටපු ප්‍රධාන ආසියානු විශ්ලේෂකයා වූ, ඇන්ඩි ෂී, චීනය දශක තුනක් ඇතුලත විශාලතම අභියෝගයට මුහුන දී සිටින බව මූල්‍ය සගරාවක් වන කයිජින් වෙත සැප්තැම්බර් 1 දා අනතුරු ඇගවීය. චීන අපනයනයන්ට බරපතල දුෂ්කරතාවයන් ඇතිකරමින් වසර 30 ක් තුල පලමු වතාවට, යුරෝපය, ජපානය සහ එ.ජ.ය එකම කාලසීමාවකදී හැකිලෙමින් යන බව ඔහු පෙන්නා දුන්නේය. ඊට අමතරව, ලාභ ලැබිය හැකි ප්‍රාග්ධනයේ දැවැන්ත ගලාඒම මගින් චීනයේ අස්ථිර දේපල බුබුල නිර්මානය කෙරී ඇත. මෙම බුබුල පිපුරුනහොත්, බොහෝ සමාගම් සහ ප්‍රාදේශීය ආන්ඩු බංකොලොත් වීමේ අර්බුදයක් ඉදිරියට පමුනුවනු ඇත.

වඩා මූලිකවම, ලාභ නිෂ්පාදන ක්‍රියාවලියක වේදිකාවක් ලෙස චීන ආර්ථික ව්‍යාප්තියේ මුලු පදනම වැඩිවන නිෂ්පාදන වියදම් මගින් අනතුරට පත් කර ඇත. අපනයන, චීන දල දේශීය නිෂ්පාදනයෙන් සියයට 40 ක් බවට ගනනය කෙරී ඇති අතර රටෙහි මුලු වාර්ෂික වර්ධනයෙන් සියයට 4 කට හිමිකම් කියයි. භූගෝලීයව භාන්ඩ මිල ඉහල යාමට පටන් ගත් 2004 සිට අපනයන සම්බන්ධ ප්‍රශ්න ඇතිවූ බව ෂී පැවසීය. වැඩිවන මිල ගනන් වැටුප් වැඩිකිරීමේ ඉල්ලීම් කරා ගමන් කරනු ඇත. එහි ප්‍රතිපලයක් ලෙස, සුලු ලාභ සහිතව ක්‍රියාත්මක වූ ඉහල ශුම ක්‍රියාකාරිත්වයක් සහිත ආයතන ගනනාවක් කඩා වැටීමේ කෙලවරටම තල්ලු කෙරෙනු ඇත.

ව්‍යාපාරිකයන් අතර පැවැති සිතිවිල්ල වූයේ මේ දේවල් හොද අතට හැරෙනු ඇති බව යැයි ෂී පැවසීය. එහි ප්‍රථිපලයක් ලෙස, සමාගම් සිය නිෂ්පාදන සැලසුම් ඒ ලෙසටම ක්‍රියාත්මක කල අතර පසුගිය අවුරුදු 3 පුරාවටම අපනයන වැඩීම ඒ ලෙසටම පවත්වාගෙන යැමට උත්සාහ දැරීය. දැන්, ප්‍රධාන වෙලඳපොලවල පසුබෑමේ තර්ජනය නිසා අපනයනකරුවන් බරපතල ප්‍රශ්නවලට මුහුන දී සිටිති. අපනයන කර්මාන්තයේ කඩාවැටීමක් ගැන බියසංකා වැඩෙමින්, පසුගිය වසර දෙකතුල හොංකොං කොටස් වෙලඳපොලෙහි ලැයිස්තුගත අපනයන සමාගම් තම කොටස් මිලගනන් සියයට 50-80 කින් පහත වැටෙනු දකිමින් පසුවෙති.

දේපල වෙලඳම් සහ කොටස් වෙලඳපොල වෙත හැරුනු නිෂ්පාදකයින් තවදුරටත් පාඩු ලැබීම නිසා ආයතනික නය වැඩිවී තිබේ. මේ වසරේ මේ වනතෙක්, ගනනින් එ.ජ. ඩොලර් ට්‍රිලියන 2.86 ක් අතුගා දමමින්, චීන කොටස් වෙලඳපොල සියයට 59 කින් පහත වැටුනේය. දේපල අයිතිවාසිකම් විකිනීම සහ දේපල වෙලඳම් ගනුදෙනු වලින් බදු අයකිරීම් මත රැඳුනු ප්‍රාදේශීය ආන්ඩුත්, බරපතල ආකාරයට නයබරින් මිරිකී සිටිති.

දේපල වටිනාකම් ඉහලයාම සමතලා වී ඇති බැවින් ඊලග 12 මාසයේදී අක්‍රියාකාරී නය සැලකියයුතු අයුරින් ඉහල යනු ඇතැයි, ෂී අනාවැකි පැවසීය. "ප්‍රශ්නය ඉතාම දරුනුයි." ඔහු අනතුරු ඇගවීය. එක් නිල ඇස්තමේන්තුවකට අනුව, මිනිසුන් මිලියන 20 කට රැකියා අහිමි කරමින්, මේ වසරේ මුල් භාගයේදී සුලු හා මධ්‍ය පරිමාන සමාගම් 65000 ක් බංකොලොත් වී ඇත. සේවක පඩිනඩි සහ බැංකු නය ගෙවීම් පැහැර හරිමින් බොහෝ සේව්‍යයෝ නිකම්ම පලාගියහ.

වෙලඳපොල ආර්ථිකයේ ප්‍රබල තැරැව් කරුවෙකු වන ෂී, ලෙඩ වූ සමාගම් වලට රජයේ කිසිඳු සහයෝගයක් ලබා දීමට විරුද්ධ විය. ඒ වෙනුවට, බංකොලොත් ව්‍යාපාරිකයන් හට තම දේපල සමග පලායැමට සහ බැංකු සමග ප්‍රධාන ගැටලු ඇති කර

ගන්නට ඉඩනොදෙන ලෙස ඔහු රජයට පැවසීය. "ඔවුන්ව ආරක්ෂාකිරීමට මුදල් වියදම් කරන ප්‍රදේශීය නිලධරයන්ගේ ක්‍රියාව හරිම මෝඩයි. මුදල් සොරකම් කරන්නට පුලුවන්. බරපතල ලෙස නයබරින් ගිලුනු ව්‍යාපාරිකයින් චීනයෙන් පිටමංවීම තහනම් කිරීම චීනයේ මූල්‍යමය සුරක්ෂිතතාව ආරක්ෂාකරන්නට, වඩා බලපාන ප්‍රතිපත්තිය" යැයි ඔහු ලිවීය.

දශකයකට පෙරාතුව ආසියානු මූල්‍ය අර්බුදයේදී, ක්‍රියාත්මක කල ලෙසට තවත් ආර්ථික ප්‍රතිසංස්කරන වටයක් ක්‍රියාත්මක කරවීම චීනයේ ප්‍රශ්නවලට ෂීගේ විසඳීමයි. එම කාලයේදී, රාජ්‍ය ආයතන සහ පොදු නිවාස මුලුමනින්ම පුද්ගලීකරනය කිරීම, ලෝක වෙලඳ සම්මේලනයට (WTO) එක්වීම සහ ජාතික මහාමාර්ග පද්ධතියක් ඉදිකිරීම බීජිං විසින් ක්‍රියාත්මක කරන ලදී . රාජ්‍ය අංශයේ රැකියා ලක්ෂ සිය ගනනක් කපා හැරුනු අතර නිවාස මිල, අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා, රාජ්‍ය මුදල් නොමැතිකමින්, අහස උසට ඉහල ගියේය. ෂීට අනුව, මෙම ඩෑකෝනියානු "වෙලඳපොල ප්‍රතිසංස්කරන" පසුගිය වසර 10 තුල සිදුවූ ආර්ථික ප්‍රසාරනයට පදනම සැපයීය.

වර්තමාන අර්බුදයට විසඳුම් ලෙස ඉදිරිපත්ව ඇති ෂීගේ යෝජනාවලට, චීන අන්තර්ජාතික සමාගම් ගොඩනැගීම, යටිතල පහසුකම් සඳහා වැඩි ආයෝජන සහ රාජ්‍ය-පාලිත මූල්‍ය ක්‍රමය තවදුරටත් රාජ්‍ය පාලනයෙන් මිදවීම ඇතුලත්ය. එවැනි ඉදිරි දර්ශනයක්, චීනය අපනයන මත තම රැඳීම අඩුකිරීම සහ දේශීය වෙලඳපොල පුලුල්කිරීම ගැන, මෑත කාලයේදී බොහෝ ආර්ථික විද්‍යාඥයින්ගේ කතා සමග එකට පැහේ. නමුත් ලාබ ශ්‍රම වේදිකාවක සිට පාරිභෝගිකයා මගින් දුවවන ආර්ථිකයක් වෙත හැරීම අනිවාර්යයෙන්ම බාධා සහිතය.

## දේශීය වෙලඳපොල

සැප්තැම්බර් 2 දා *වෝල් ස්ට්‍රීට් ජර්නලය*, චීනයේ දේශීය පරිභෝජනය පුලුල් කිරීමේ ගැටලු සමහරක් ගෙනහැර දැක්වීය. දල දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) කොටසක් ලෙස ගත්විට සිදුව ඇත්තේ වැඩි වීමක් නොව 1980 ගනන්වලදී සියයට 50 ක් ව පැවති චීනයේ පරිභෝජනය, දැන් සියයට 37 දක්වා අඩු වීමකි. ධාරිතාවට වඩා අතිවිශාල ඉහල යෑමකට තුඩුදුන්, නිශ්චල දේපල ආයෝජන ද.දේ.නි. යෙන් සියයට 45 ක් විය. "චීනයේ සාර්ව ආර්ථික අසමානකම්වලට යටින් දිවෙන්නේ දේශපාලන ගනනය කිරීමකැ"යි පුවත්පත විස්තර කලේය. "සෑම වසරක් පාසාම නාගරික ප්‍රදේශවලට සංක්‍රමනය වන මිලියන 10 ක රැකියා සොයා යන්නන් සමග, බහු ජන විරැකියා තත්වය සහ සමාජ අසහනය වලක්වාලීම සඳහා චීනයට බොහෝ රැකියා සපයන්නට සිදුව තිබිනි. පරිභෝජන ආදායම සහ වියදම බොහෝ දුර්වල වූ බැවින් ආන්ඩුවට ප්‍රාග්ධන ආයෝජනය සහ අපනයන පොම්ප කිරීම හැර වෙනත් විකල්පයක් නැති බව හැගිනි."

දේශීය පරිභෝජනය සහ වැඩි වැටුප් වෙත හැරීම, පිලිබදව දැවැන්ත සංස්ථාපිත අවශ්‍යතා මගින් විරෝධතා පලවිනි. ප්‍රාදේශීය නිලධාරීන්ට රැකියා නිර්මානය කිරීම දැනටමත් බොහෝ අපහසුය. පසුගිය දශකයේදී ඵලදායීතාවය ඉහලනැංවීම නිසා ඇස්තමේන්තුගත මිලියන 20 ක නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියා නැතිකර දැමිනි. පලාත් හා ප්‍රාදේශීය ආන්ඩු, චීනය තුලින් පමනක් නොව, වියට්නාමයෙන් සහ ඉන්දියාවෙනුත් ආයෝජන සඳහා වැඩෙන තරඟකාරිත්වයකට මුහුන දෙන තතු තුල වැඩි වැටුප් ලබා දීම කල නොහැක්කකි.

පාරිභෝගිකයින්ගේ සාක්කු තුලට මුදල් දැමීමේ අනෙකුත් ක්‍රම වලටද විරුද්ධත්වය මතුව ඇත. පාරිභෝගික තැන්පතු සඳහා පොලී අනුපාත ඉහල දැමීමට රජයට හැකියාව ඇති නමුත්, තම නය ආපසු ගෙවීමේ කිසිඳු ඉහලදැමීමකට ව්‍යාපාර විරුද්ධ වනු ඇත. යුවාන් මුදල තවදුරටත් අධි ප්‍රමානය වීමෙන් ආනයනික භාන්ඩ සඳහා දේශීය මිලදීගැනීමේ ශක්තිය වැඩිවන නමුත්, එමගින් අපනයන තරඟකාරිත්වයට පහර වදිනු ඇත. රජයට පුද්ගලික ආදායම් බදු පහලදැමිය හැකි නමුදු, ඉන් අදහස් වන්නේ ආයතනික බදු වැඩිවීමක් නම්, බලගතු ව්‍යාපාරික ප්‍රභුව ඊට එරෙහි වනු ඇත.

සේවකයන් සඳහා විශ්‍රාම වැටුප්, සමාජ ආරක්ෂන ආධාර සහ වෙනත් ප්‍රතිලාභ සපයන ලෙසට සේව්‍යයන්ට බලකරන නව කම්කරු නීතියක් මේ වසරේ හඳුන්වා දුනි. චීනයේ අනෙකුත් රෙගුලාසි සේ මෙයත් නීතිය සහ එහි භාවිතාව දුර්වල වීම නිසා බොහෝ ව්‍යාපාර ලෙහෙසියෙන්ම මගහරිනු ඇත. පොදු පාසල්, සෞඛ්‍ය සේවාව සහ විරැකියා දීමනාවල ආයෝජනය කරමින් චීනයට දේශීය පරිභෝජනය වැඩිකරගත හැකි අතර එනිසාම කම්කරුවන්ට සහ ග්‍රාමීය දුගීන්ට අසනීප හා රැකියා නැතිවීම වෙනුවෙන් ඉතිරි කරන්නට ඇවැසි නොවනු ඇත. නමුත් *වෝල් ස්ට්‍රීට් ජර්නල්* විස්තර කරන ලෙසට, "පාරවල් සහ පාලම් සෑදීම් වෙනුවෙන් මුදල් වියදම් කරන්නට සැමවිටම වැඩි උනන්දුවක් ගන්නා බොහෝ ප්‍රාදේශීය රජයන්, මෙවැනි වැඩපිලිවෙල්වලට විරුද්ධය. මෙම ක්‍රියාවලියෙන් ඉතා ඉක්මනින් ද.දේ.නි. ඉහල යා හැකි නමුත්, එයම දූෂන සහ ගෙවීම් සඳහා වැඩි අවස්ථාවන් ලබා දෙයි."

මේ තාක් දුරට ආර්ථික පසුබැසීම ක්‍රමානුකූල විය. නමුත් එහි අනතුරු සංඥා පවතී. ජූලි මාසයේදී බදු ආදායමේ සියයට 13.8 ක වාර්ෂික වර්ධනයක් චීන මුදල් අමාත්‍යාංශය වාර්තා කලේය. මෙය ගිය වසරේ

එම මාසයේදී සහ මේ වසරේ පලමු භාගයේදී පැවතුනු රේට්ටුවට වඩා පස් ගුනයකින් අඩුය. මෙම නිවේදනය, වැටෙන වර්ධන රේට්ටු පාලනය කිරීමට බදු කපාහැරීම් වැනි උනන්දු කිරීමේ ප්‍රතිපත්ති සඳහා චීනයට ඇත්තේ අඩු ඉඩකඩක් බවට සැකසංකා ඉහල නැංවීය.

සියයට 10.4 ක වර්ධනයක් සහිතව තවමත් වර්ධනය වන අතරේදී චීන ආර්ථිකය, ඇතුලත පරස්පරවිරෝධයන් ගෙන් ගහනව පවතී. එම පරස්පර විරෝධයන් ප්‍රධාන බාහිර ගැස්මකින් ප්‍රහාරයට බදුන් වූ විට දේශපාලන හා සාමාජීය මෙන්ම සුවිශේව ආර්ථික අර්බුදයක් ඉතා ඉක්මනින් පැන නැගෙනු ඇත. එනිසයි චීන ආර්ථික විශේශඥයින් එ.ජ. සිදුවීම් දෙස බියජනකව බලාසිටිනුයේ. බිලියන සිය ගනනක එ.ජ. ආයෝජනවලට උරුමකම් කියන බීජිං හට එ.ජ. යේ මූල්‍යමය දියවීම තවදුරටත් සිදු වුවහොත් දැවැන්ත පාඩු අත්විදීමට සිදුවනු ඇති අතර ඊනියා චීන ආශ්චර්යය පවත්වා ගෙන ගිය විදේශ ආයෝජන ගැලීම් නතරවනු ඇත.

© www.wsws.org